**ශීර්ෂ 153 - ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| **ශීර්ෂ** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
| 287 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව |
| 288 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලැසුම් දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| ------ | ---------------------------------- | ---------------------------------- |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 2015 ඔක්තෝබර් 09 දින. |
| 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 2015 සැප්තැම්බර් 17 දින. |
| 287 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | 2015 සැප්තැම්බර් 02 දින. |
| 288 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 2015 සැප්තැම්බර් 17 දින. |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 2015 අගෝස්තු 14 දින |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරීන්ගේ වගකීම**

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 04 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,150.3 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 6,025.1 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 2.3 ක සිට රු.මිලියන 71.8 ක පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.7 ක සිට සියයට 3.7 ක පරාසයක ප්‍රමාණයකින් පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 153 | 2,680.1 | 2,608.3 | 71.8 | 2.68 |
| 286 | 337.7 | 332.1 | 5.6 | 1.66 |
| 287 | 308.0 | 305.7 | 2.3 | 0.75 |
| 288 | 2,511.6 | 2,477.6 | 34.0 | 1.35 |
| 327 | 312.9 | 301.4 | 11.5 | 3.68 |
| **එකතුව** | **6,150.3** | **6,025.1** | **125.2** | |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

වැව්ලි භෝග සිතියම් ගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේදී ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලැසුම් දෙපාර්තමේන්තුවට වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ රු.10,000,000 ක ප්‍රතිපාදනවලින් රු.4,600,000 ක් දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් කාර්යාලවලට ලබා දී තිබුණි.

## 2.2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු 02 ක් විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් සඳහා එකතුව රු.මිලියන 167.4 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 201 ක ආදායම් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 84.92 ක් හා සියයට 136.09 ක ප්‍රමාණයකින් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම/ (ඌනතාවය) |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.02.01.03 | 52.4 | 44.5 | (7.9) | (15.08) |
| 20.03.02.04 | 115.0 | 156.5 | 41.5 | 36.09 |
| **එකතුව** | **167.4** | **201.0** | **33.6** | **20.07** |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 04 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15301 | 13.0 | 11.6 | 4.2 | 8.0 | 44.0 | 27.7 |
| 28601 | 14.0 | 13.9 | 12.0 | 12.0 | 70.0 | 52.6 |
| 28701 | 20.0 | 9.6 | 7.0 | 10.0 | 65.0 | 36.2 |
| 28801 | 150.0 | 119.6 | 100.0 | 87.3 | 400.0 | 328.8 |
| 32701 | 15.0 | 14.7 | 7.0 | 9.9 | 50.0 | 47.9 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 04 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 209.6 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. මිලියන |
| ඉඩම් හා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0064/000 | 0.2 |
| ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0141/000 | 70.7 |
| මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0143/000 | 138.2 |
| ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලැසුම් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0186/000 | 0.5 |
| **එකතුව** | | **209.6** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 7 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

**3. ශීර්ෂ 153 - ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් යාවත්කාලීන කර නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 843 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.20,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ වර්ෂය තුළ එකතු කිරීම්වල එකතුව රු.28,587,262 ක් වූ අතර විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ 04 ආකෘතියෙහි වර්ෂය තුළ එකතු කිරීම්වල එකතුව රු.16,453,930 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.12,133,332 ක වෙනසක් පැවැතුණි.

**3.3 අග්‍රිම ගිණුම**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුත් වුවත්, අවස්ථා 13 කට අදාලව ලබා දි තිබුණු එකතුව රු.273,034 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාස 01 ක සිට මාස 07 ක් දක්වා කාල පරාසයක් තුළ අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි. එක් අත්තිකාරමක් පියවීමට පෙර නිලධාරීන්ට නැවත අත්තිකාරම් ලබා දී තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

විෂය අංක 15301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.284,817 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණු විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂය රු.144,418 ක්වූ අතර ඉන් රු.47,592 ක ශේෂයක් වර්ෂ 07 ක කාලයක පැවැත එමින් තිබුණි.

(ඇ) සේවය හැර ගිය නිලධාරීන්ගේ වර්ෂ 09 ඉක්මවූ රු. 96,928 ක ශේෂයක් 2015 ජූලි 15 දින වන විටත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**------------------------------------**

**3.5.1 වත්කම් කළමනාකරණය**

**--------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම<br>රු. | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| (i) | ලී බඩු හා සවිකිරීම් | 08 | තොරතුරු ඉදිරිපත් කර නැත | තොරතුරු ඉදිරිපත් කර නැත |
| (ii) | පරිගණක හා උපාංග | 80 | තොරතුරු ඉදිරිපත් කර නැත | තොරතුරු ඉදිරිපත් කර නැත |
| (iii) | කාර්යාල උපකරණ | 46 | තොරතුරු ඉදිරිපත් කර නැත | තොරතුරු ඉදිරිපත් කර නැත |
| (iv) | වෙනත් වත්කම් | 18 | තොරතුරු ඉදිරිපත් කර නැත | තොරතුරු ඉදිරිපත් කර නැත |

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව/ඒකක ගණන/ප්‍රමාණය | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම<br>රු. | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| (i) | මෝටර් වාහන | 09 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | තොරතුරු ඉදිරිපත් කර නැත | තොරතුරු ඉදිරිපත් කර නැත |
| (ii) | මෝටර් වාහන | 16 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | තොරතුරු ඉදිරිපත් කර නැත | තොරතුරු ඉදිරිපත් කර නැත |
| (iii) | මෝටර් වාහන | තොරතුරු ඉදිරිපත් කර නැත | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | මිලියන 36 | තොරතුරු ඉදිරිපත් කර නැත |
| (iv) | මෝටර් වාහන | 17 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | තොරතුරු ඉදිරිපත් කර නැත | තොරතුරු ඉදිරිපත් කර නැත |

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 ට අඩු බේරුම් නොකළ බැරකම් රු. 23,790,744 ක් විය.

**3.6 කාර්යසාධනය**

**-----------------**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**--------------------------------------------------**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය වු අතර එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ දැනට ක්‍රියාත්මක වන ඉඩම් අත්පත් ලිපිගොනු 4,408 කින් වන්දි ගෙවා වැඩ අවසන් වූ ලිපිගොනු ගණන 122 ක් වී තිබුණු අතර අක්‍රීය ලිපිගොනු ගණන 298 ක් විය. තවද ඉඩම් ආඥාපනතේ 38(අ) අතුරුවිධාන ආඥාව අනුව නිකුත් කර තිබුණු අවසන් ගොනු ගණන 760 ක්ද, 2014 වර්ෂයේදී පමණක් 38(අ) ආඥාව නිකුත් කිරීමට තිබෙන ගොනු ගණන 914 ක් ද වී තිබුණි. 38(අ) අතුරු විධාන ආඥාව යටතේ ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් ලිපිගොනු විශාල සංඛ්‍යාවකට වන්දි හා ඊට අදාළ පොළියද ගෙවීමට අමාත්‍යාංශයට සිදුවන බව නිරීක්ෂණය විය.

(ii) නැවත පදිංචි කිරීම් සඳහා සිදුකරන ලද මිනින්දෝරු දෙපාර්තමේන්තු මැනුම්වල ප්‍රගතිය අනුව මුලතිව් දිස්ත්‍රික්කයේ මැනුම් කටයුතු කිරීම සඳහා වූ බිම් කැබලි 5,842 කින් මැනුම් කටයුතු බිම් කැබලි 2,784 ක පමණක් අවසන් කර තිබුණු අතර ප්‍රගතිය සියයට 48 ක් වි තිබුණි. තවද මඩකලපුව දිස්ත්‍රික්කයේ බිම් කැබලි 3,953 කින් කැබලි 856 කද , වවුනියා දිස්ත්‍රික්කයේ කැබලි 8,949 කින් 4,602 කද පමණක් මැනුම් කටයුතු අවසන්ව තිබූ අතර ප්‍රගතිය පිළිවෙලින් සියයට 22 ක් හා සියයට 51 ක් වී තිබුණි.

(iii) ආරක්ෂක හමුදාවන් සඳහා සිදුකරන ලද 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ වූ අත්පත් කරගැනීමේ මැනුම්වලින්

යාපනය දිස්ත්‍රික්කය සඳහා වූ මැනුම් ඉල්ලීම් 86 කින් 45 ක පමණක් මැනුම් කටයුතු අවසන් කර තිබුණි. එලෙසම ආරක්ෂක හමුදාවන් සඳහා සිදුකරන ලද 5 වන වගන්තිය යටතේ වූ අත්පත් කර ගැනීමේ මැනුම්වලින් මන්නාරම දිස්ත්‍රික්කය සඳහා මැනුම් ඉල්ලීම් 21 න් 9 ක්ද, යාපනයේ ඉල්ලීම් 4 න් 2 ක් පමණක කටයුතු අවසන් කර තිබුණි. වවුනියාව සඳහා සිදු කරන ලද මැනුම් ඉල්ලීමද වර්ෂය තුළදී කටයුතු අවසන් කර නොතිබුණි.

(iv) වර්ෂය තුළදී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත රු.50,000,000 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර දෙපාර්තමේන්තුව ඉන් රු.41,687,946 ක් වැය කර තිබුණි. ඉතිරිය රු.8,312,054 ක් හෙවත් සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 16.6 ක් වී තිබුණි. 2014 වර්ෂයේදී ඉදිරිපත් වූ ගැටළු 199,641 කින් ගැටළු 81,954 ක් විසඳා තිබුණි. ඒ අනුව වියදමට සාපේක්ෂව සමස්ත භෞතික ප්‍රගතිය පහළ මට්ටමක පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ) සැලැසුම් කිරීම**

-----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව වූ ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඉඩම් ප්‍රතිපත්ති අංශයේ සමහර ඉලක්කයන්හී ප්‍රගතිය ඉඩම් සංවර්ධන අංශයේ ප්‍රගතිය තුළ දක්වා තිබුණු නමුත් සම්පූර්ණ ඉලක්කයන්හී ප්‍රගතිය දක්වා නොතිබුණි.

(ii) ඉඩම් අත්පත් කර ගැනීමේ අංශයේ 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව මූල්‍ය ඉලක්කය දක්වා තිබුණද, ප්‍රධාන කාර්යයන් අනුව භෞතික ඉලක්කය දක්වා නොතිබුණි. තවද කාර්යසාධන වාර්තාවේ ප්‍රධාන කාර්යයන්ට අනුව මූල්‍ය ප්‍රගතිය දක්වා නොතිබුණි.

(iii) අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂයේ බිම් සවිය ඉලක්ක ප්‍රධාන කාර්යයන් අනුව දක්වා තිබුණද, කාර්යසාධන වාර්තා පිළියෙල කිරීමේදී ප්‍රගතිය ඊට අනුකූලව දක්වා නොතිබුණි.

## 3.7 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂය සඳහා අමාත්‍යාංශය ලැප්ටොප් පරිගණක 02 ක් හා ලේසර් ප්‍රින්ටර්ස් 04 ක් මිල දී ගැනීමට තීරණය කර තිබුණද වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කිරීමේදී එම අවශ්‍යතාවය හා ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල හඳුනාගෙන නොතිබුණි. මිල ගණන් ලැබී තිබුණු ආයතන දෙකක අවම මිල මත අදාළ භාණ්ඩ මිලදී ගෙන තිබුණද ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් පරිගණක 46 ක් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කිරීමේදී මෙම අවශ්‍යතාවය හා ඒ සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද යන්න හඳුනාගෙන නොතිබුණි.

  තවද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අමාත්‍යාංශය සඳහා පරිගණක 46 මිලදී ගත යුත්තේ කුමන ආයතනයෙන්ද යන්න නිශ්චිතව හඳුනා ගෙන නිර්දේශය ඉදිරිපත් කර නොතිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතු වුවත්, කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට ප්‍රථම රු.4,236,600 කට පරිගණක 46 ක් අමාත්‍යාංශය වෙත එවන ලෙසට තෝරාගත් ආයතනයට දන්වා තිබුණි. පරිගණක 2014 දෙසැම්බර් 09 දින සපයා තිබුණු අතර 2014 දෙසැම්බර් 15 දින ගිවිසුමකට එළඹ තිබුණි. තවද ලංසු විවෘත කිරීම සඳහා ඇගයීම් කමිටු දෙකක් පත්කර තිබූ අතර ලංසු විවෘත කිරීමේ කමිටුව පත්කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

- 2014 වර්ෂයේදී අමාත්‍යාංශය ලැප්ටොප් පරිගණක 02 ක් හා ලේසර්

ප්‍රින්ටර්ස් 04 ක් මිලදීගෙන තිබුණද, එම භාණ්ඩ නියමිත දිනට ප්‍රථම අමාත්‍යාංශයට ලැබී නොතිබුණු අතර ප්‍රමාද වූ දින 22 ක් වූ කාලයක් සඳහා ප්‍රමාද ගාස්තුවක් අයකරගැනීම සම්බන්ධයෙන් කිසිඳු කොන්දේසියක් පනවා නොතිබුණි.

## 3.8 කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයේ වාහන අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) වාහනයක් අළුත්වැඩියා කිරීමේදී සුළු ප්‍රසම්පාදන කමිටුව මගින් රු.146,380 ක වැඩිම මිල ඉදිරිපත් කළ ආයතනය තෝරාගෙන තිබුණු අතර එම ආයතනය විසින් නැවත ඉදිරිපත් කළ රු.43,050 ක අමතර ඇස්තමේන්තුවක්ද සමගින් අළුත්වැඩියාව සඳහා රු.189,430 ක් වැය කර තිබුණි. තවද එම වාහනය සඳහා 2014 වර්ෂයේදී අවස්ථා 17 ක දී රු.559,544 ක අළුත්වැඩියා වියදමක් කර තිබුණු අතර තවදුරටත් රු.363,670 ක අළුත්වැඩියාවක්ද සිදු කිරීමට අනුමැතියද ලබා දී තිබුණි.

(ii) අමාත්‍යාංශය සතු තවත් වාහනයක් අළුත්වැඩියාවේදී එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා අළුත්වැඩියාව සිදු කර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.399,578 ක් වැය කර තිබුණි. එසේම එම වාහනයම නැවත අළුත්වැඩියා කිරිම සඳහා රු.473,430 කට එම ආයතනයටම ලබාදීමට තීරණය කර තිබුණි. තවද මෙම වාහනවල අළුත්වැඩියාවන් නිම කිරීමට ප්‍රමාද වූ කාලයන් සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධයෙන් 1950 මාර්තු 09 දිනැති ඉඩම් අත්පත් කරගැනීමේ පනත අනුව කටයුතු කළ යුතුව තිබුණු අතර එය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i). 2014 වර්ෂයේ ඉඩම් අත්පත් කරගැනීම සඳහා වන්දි මුදල් ලෙස රු.1,704,695,720 ක් ගෙවා තිබුණු අතර ලිපිගොනු 100 ක් සඳහා පොලී ලෙස රු.525,038,643 ක් ගෙවා තිබුණි. ඒ තුළ 2005 වර්ෂයේ දී අත්පත් කර ගෙන තිබූ

ඉඩම් වෙනුවෙන් පමණක් රු.110,375,825 ක් වූ පොලී මුදලක් ඇතුළත්ව තිබුණි. 38(අ) අතුරු විධාන ආඥාව යටතේ ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු කරනු ලබන්නේ ඉඩම් අත්පත් කර ගැනීම කඩිනමින් සිදු කිරීම සඳහා වුවත්, අත්පත් කර ගැනීම් සඳහා වන්දි ගෙවීම අවසන් වන දිනය දක්වාම පොලී ගෙවීමට සිදුවීමෙන් 38(අ) අතුරු විධාන ආඥාව යටතේ අත්පත් කර ගැනීම් වෙනුවෙන් අමාත්‍යාංශය විශාල වියදමක් කර තිබුණි.

(ii). දඹුල්ල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2006 ඔක්තෝබර් 31 දින අත්පත් කර ගත් ඉඩම් වෙනුවෙන් වන්දි ලෙස රු.මිලියන 3.9 ක් ඇස්තමේන්තු කර තිබුණි. විගණිත දිනය වන විටත් පොලීය සමඟ ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි ලෙස රු. මිලියන 6.5 ක් ගෙවා තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත වියදම සියයට 66.67 කින් ඉක්මවා වියදම් කර තිබුණි.

(iii). සමාලෝචිත වර්ෂයේදී ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලය වෙනුවෙන් ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.3,250,000 ක් වුවද, ඉඩම සඳහා වන්දි හා පොලී වශයෙන් රු.12,380,742 ක් වැය කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත වටිනාකම රු.9,130,742 කින් ඉක්මවා වැය කර තිබුණි.

(iv). නාගරික සංවර්ධන අධිකාරියට හොරණ බස් නැවතුම්පළ සංවර්ධනය කිරීම සඳහා රූඩ් 02 පර්චස් 17.5 ක් වූ නොබෙදූ ඉඩමක් ඉඩම් අමාත්‍යාංශය විසින් රු.10,225,000 ක් ගෙවා අත්පත් කර ගෙන තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉඩමේ පර්චස් 6ක ප්‍රමාණයක් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමේ හිමිකරු වෙතම නැවත ලබාදී තිබුණු නමුත් ඔහු විසින් පර්චස් 10.48 ක ප්‍රමාණයක ගොඩනැගිල්ල ඉදිකර තිබුණි. මෙම අත්පත් කර ගැනිම වෙනුවෙන් වන්දි හා පොලී සඳහා රු.2,519,825 කට ආසන්න වියදමක් කිරිමට නියමිතව තිබුණි. කෙසේවුවද "රජයට අත්පත් කර ගත් ඉඩමේ කොටසක්ද ඇතුළත්වන පරිදි ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ බැවින් එම ඉඩම් කොටස දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීමට තීරණය කර තිබුණු බව" අමාත්‍යාංශ ලේකම්වරයා මා වෙත දන්වා තිබුණි.

(v). වැය කළ යුතු වියදම පිළිබඳව නිවැරදි ඇස්තමේන්තු කිරිමකින් තොරව අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත අවස්ථා 25කදී රු.203,407 ක තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. එම අත්තිකාරම්වලින් සියයට 27 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් එම අත්තිකාරම් වැය නොකර ඉතිරි වි තිබුණි. ඒ

අනුව මුදල් රෙගුලාසි 371(4) ප්‍රකාරව කටයුතු නොකර අත්තිකාරම් නිකුත් කර තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 18 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 440 | 392 | 48 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 44 | 8 |
| | **එකතුව** | **518** | **458** | **60** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 60 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂ 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

## 4.1 විසර්ජන ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 57ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 4.2 පොදු තැන්පත් ගිණුම

අවස්ථා 19 කට අදාල එකතුව රු.65,350,234 ක තැන්පත් ශේෂ වසර 2 ඉක්මවා තිබුණත්, එම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.3 ආදායම් ගිණුම**

**-----------------**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේතයකට ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතයට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**20.02.01.03 දරන ආදායම් සංකේතය - ඉඩම් හා අනෙකුත් බදු කුලී**

**------------------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාලව රු.මිලියන 50 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 44 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 89 ක් වී තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.20,278,626 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයකට අදාල විය. එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට හිඟ ආදායම රු.20,278,626 ක් වූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව එය සියයට 42 කින් වැඩි වි තිබුණි. තවද වර්ෂ 02 ක් ඉක්මවූ කාලයක සිට හිඟහිටි ආදායම රු.5,630,837 ක් වි තිබුණි.

(ඈ) ආදායම් එකතු කිරීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව කටයුතු කර ආදායම් එකතු කිරීම කළ යුතු වුවත්, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල හතක එකතුව රු.1,396,214 ක් වූ හිඟ ආදායමින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් අයකර ගැනිමට නොහැකි වී තිබුණි.

(ඉ) 2014 වර්ෂය සඳහා වූ රු.50,000,000 සංශෝධිත ඇස්තමේන්තුව ගිණුමෙහි රු.45,000,000 ක් ලෙසින්ද, රු.52,400,000 ක් වූ මූලික ඇස්තමේන්තුව ගිණුමෙහි රු.36,000,000 ක් ලෙසද දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.50,000,000 ක් වුවද, ශුද්ධ ආදායම රු. 44,477,083 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 89 ක් ආදායම් උපයා තිබුණු අතර පසුගිය වර්ෂයේදී ඇස්තමේන්තුගත ආදායම රු. 42,000,000 ක් වුවද ශුද්ධ ආදායම රු. 49,503,519 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 117 ක ප්‍රමාණයක ආදායම් උපයා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව ශුද්ධ ආදායමේ අඩුවීමක් නිරීක්ෂණය විය.

(උ) 2013 වර්ෂය හා සැසඳීමේදී 2014 වර්ෂයේ ශුද්ධ ආදායමේ අඩුවීම රු.5,026,436 ක් වූ අතර ප්‍රතිශතයක් වශයෙන් සියයට 10 කි. නමුත් 2013 වර්ෂය හා සැසඳීමේදී 2014 වර්ෂයට අදාල ආදායමේ (හිඟ බදු කුලී හැර) අඩුවීම රු.12,228,842 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 36 කි. නව බදුකර ආදායම අඩුවීම විචලනයට හේතු වූ බව කොමසාරිස් ජනරාල්වරයා මා වෙත දන්වා තිබුණි.

(ඌ) 2013 වර්ෂය ආරම්භයේ හිඟ ආදායමට අනුරූපීව රැස්කළ ආදායම් ප්‍රමාණය සියයට 66 ක් වූ අතර 2014 වර්ෂයේ ආරම්භක හිඟ ආදායමට අනුරූපීව රැස්කළ ආදායම් ප්‍රමාණය සියයට 28 ක් පමණි. ඒ අනුව 2014 වර්ෂයේ ශුද්ධ ආදායම් පහත වැටීම කෙරෙහි හිඟ ආදායම් රැස්කිරීමේ දුර්වලතාවයද හේතු වූ බව නිරීක්ෂණය විය.

## 4.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 28601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,453,238 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරින් 15 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු ණය ශේෂය රු.711,521 ක් වූ අතර ඒ තුළ වර්ෂ 15 ඉක්මවූ කාලයක සිට පැවැත එන

රු.48,968 ක ණය ශේෂයක්ද විය. මෙම ණය ශේෂයන් නිලධාරීන් විශ්‍රාම ගන්නා ලද අවස්ථාවේදී විශ්‍රාම පාරිතෝෂික මුදලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වැඩ තහනම් කළ නිලධාරීන් 8 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.642,927 ක් වූ අතර ඉන් වර්ෂ 5 ඉක්මවූ රු.349,719 ක ණය ශේෂයක්ද පැවතුණි. වැඩ තහනම් කළ නිලධාරීන් වෙනුවෙන් අදාළ විනය පරීක්ෂණ පවත්වා අවසන් කර අදාළ නියෝග කඩිනමින් ක්‍රියාත්මක කර ණය මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) සේවය අත්හැර ගිය නිලධාරින් 8 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.272,113 ක් වූ අතර ඉන් නිලධාරීන් 6 දෙනෙකුගෙන් අයවිය යුතු රු.182,955 ක ණය ශේෂ වර්ෂ 10 කට වඩා පැරණි ශේෂයයන් විය.

(ඉ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව පළාත් සභාවලට මුදාහල නිලධාරීන්ගේ ණය ශේෂ අදාල පළාත් සභාවෙන් එකවර අයකර ගැනීමට කටයුතු කළ යුතු විය. එම චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාර එසේ එකවර අයකරගත නොහැකි නම් අදාල පළාත් සභාවෙන් මාසිකව ණය වාරිකය හා පොළිය ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු විය. 2014 දෙසැම්බර් 31 දිනට පළාත් සභා 03 කට මුදාහැර තිබුණු නිලධාරීන් 13 දෙනෙකුගෙන් අය විය යුතු රු.210,368 ක ණය ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙහි 1.1.6 හා 1.1.7 ඡේද ප්‍රකාරව නිලධාරියෙකු ස්ථාන මාරුවීම් ලබා මාස 03 ක් ගතවීමෙන් පසු නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්විය යුතු වුවද, 2014 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 9 දෙනෙකුගෙන් අය නොවූ එකතුව රු.183,524 ක ණය ශේෂයන් වූ අතර ඉන් මාස 06 ඉක්මවූ රු.1,000 ක ණය ශේෂයක් හැර ඉතිරි රු.182,524 ක ණය ශේෂයන් වසර 23 ඉක්මවූ ණය ශේෂ බව නිරීක්ෂණය විය.

(උ) 2014 ජුනි 03 දින බස්නාහිර පළාත් සභාවෙන් ස්ථාන මාරුවී පැමිණි නිලධාරියෙකුගේ රු.225,072 ක ණය ශේෂයක් හා 2014 සැප්තැම්බර් 03 දින දකුණු පළාත් සභාවෙන් ස්ථාන මාරුවී පැමිණි නිලධාරියෙකුගේ රු.207,300 ක ණය ශේෂයක් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර නොතිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

**(අ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ඉඩම් අමාත්‍යාංශය සතු වාහන 09 ක් හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.3,348,630 ක් වූ අතර, සියළුම බැරකම් වර්ෂ 01 ට අඩු කාලයක සිට පැවැත එමින් තිබුණි.

**4.6 කාර්යසාධනය**

2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2014 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව පසුගිය වසරට සාපේක්ෂව ප්‍රගතිය දක්වා තිබුණද එක් එක් කටයුත්තෙහි වාර්ෂික ඉලක්කය දක්වා නොතිබුණි.

(ආ) 2014 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී කොට්ඨාශ දින වැඩසටහන්, ඉඩම් ගැටළු විසඳීමේ ජංගම සේවා සහ අන්තර් පළාත් වාරිමාර්ග, ඉඩම් ව්‍යාපෘති හා පළාත් සභා මට්ටමින් රජයේ ඉඩම් ගැටළු විසඳීම සම්බන්ධයෙන් පූර්ව වර්ෂයේ විසඳීමට නොහැකිව ඉතිරිව ඇති ගැටළු සංඛ්‍යාව දක්වා නොතිබුණි.

**(ඇ)** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව හිඟ බදු අයකර ගැනීමට සැලැසුම් කළ ප්‍රමාණය වර්ෂය ආරම්භයේ හිඟ ආදායමින් සියයට 75 වුවද, වර්ෂය තුළ හිඟ ආදායමින් රැස්කළ ප්‍රමාණය සියයට 28 ක් පමණක් වී තිබුණි.

(ඇ) 2015 ජුනි 10 දින වන විටත් රේඛා චිත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය සම්බන්ධ තොරතුරු 2014 පළමු කාර්තුව සඳහා පමණක් ඉදිරිපත් කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 106 කට අදාළ තොරතුරු ඉදිරිපත් කර තිබුණු අතර දීමනා පත්‍ර සකස් කිරීමට ඉදිරිපත් කළ රේඛා චිත්‍ර ප්‍රමාණය 9,831 ක් වූ අතර ඉන් 7,702 ක ප්‍රමාණයක් සකස් නොකර ඉතිරිව පැවතුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 78 ක් වි තිබුණි. ඒ අනුව රේඛා චිත්‍ර නිකුත්

කිරීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි.

(ඉ) උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිෂන් සභාව යටතේ ඉඩම් හා සම්බන්ධ ගැටළු විසඳීම පිළිබඳව පරීක්ෂාවේදී වූ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උතුරු නැගෙනහිර පළාත්වලින් ගැටළු 167,786 ක් 2014 වර්ෂයේ ඉදිරිපත් වී තිබූ අතර ඉන් ගැටළු 100,266 ක් වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 60 ක් වි තිබුණි.

(ii) ඉඩම් ලේඛන යාවත්කාලීන කිරීම සඳහා ගැටළු 31,825 ක් ඉදිරිපත් කර තිබුණු අතර ඉන් ගැටළු 17,411 ක සංඛ්‍යාවක් සම්බන්ධයෙන් වර්ෂය අවසන් වන විටත් ඉඩම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. එය ප්‍රතිශතයක් ලෙස ගැටළු සංඛ්‍යාවෙන් සියයට 55 ක් වී තිබුණි.

(iii) පූර්ව වර්ෂයේ අවසානයේ විසඳීමට නොහැකි වූ ගැටළු පිළිබඳව මෙම වර්ෂය ආරම්භයේ ශේෂයන් ලෙස දක්වා නොතිබුණි.

**4.8 අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අවිධිමත් ස්වභාවයේ ගනුදෙනු නිරීක්ෂණය විය. එවැන් ගනුදෙනුවලින් කිහිපයක් පහත දැක්වේ.

**(අ) බිම්සවිය වැඩසටහන යටතේ දිරි දීමනා ගෙවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බිම් සවිය වැඩසටහන වෙනුවෙන් 2013 වර්ෂයේ හා 2014 වර්ෂයේ පිළිවෙලින් රු.1,186,240 ක් හා රු.3,809,495 ක දිරි දීමනා ගෙවා තිබුණු අතර ඒ අනුව 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ සියයට 21 ක ප්‍රතිශතයකින් දිරි දීමනා වැඩි කර තිබුණි. නමුත් බලපත්‍ර, දීර්ඝ කාලීන බලපත්‍ර හා දීමනා පත්‍ර සංඛ්‍යාව 2013 හා 2014 වර්ෂවලට අදාලව පිළිවෙලින් 51,042 ක් 47,614 ක් වූ අතර ඒ අනුව 2013 වර්ෂයට සාපේක්ෂව ලබාදී තිබුණු බලපත්‍ර සංඛ්‍යාව සියයට 7 කින් අඩු වී තිබුණි.

(ii) දීමනා පත්‍ර, බලපත්‍ර සහ දීර්සකාලීන බලපත්‍ර නිකුත් කිරීම සඳහා මෙම දිරිදීමනා ක්‍රමය යටතේ 2013 වර්ෂයට අදාලව 2014 වර්ෂයේ රු.3,809,495 ක් දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණු අතර එහිදී සමස්ත වටිනාකමෙන් සියයට 67 ක් එනම් රු.2,551,195 ක් නිලධාරීන් තිදෙනෙකු අතර පමණක් බෙදී ගොස් තිබුණි.

(iii) දීමනා පත්‍ර, බලපත්‍ර සහ දීර්සකාලීන බලපත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ වන නමුත් ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන් කිහිපදෙනෙකු සඳහා පමණක් ඉහළ ප්‍රතිශතයක් හිමිවන ආකාරයට දිරි දීමනා යෝජනා ක්‍රමය සකස් කර තිබුණි. ආයතනයේ 485 ක් පමණ වූ සේවක මණ්ඩලයක් අතුරින් දිරිදීමනා සඳහා හිමිකම් ලබා තිබුණේ නිලධාරීන් 42 ක් පමණක් වී තිබුණි. දිරි දීමනාව බෙදී යන ආකාරය අදාල අංශ ප්‍රධානීන්ගේ තීරණ මත රදා පැවැතුණු බැවින් එම නිලධාරීන් අතරද දිරිදීමනාව බෙදීයාමේ අසාමාන්‍ය විෂමතාවයක් පැවතුණි.

(iv) ඉඩම් අමාත්‍යාංශයට අනුව බිම් සවිය වැඩසටහන යටතේ 2014 වර්ෂයේ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 43,186 ක් වුවද, දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාවට අනුව එය 42,631 ක් වූයෙන් වෙනස 555 ක් විය. තවද ඉඩම් අමාත්‍යාංශයට අනුව සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ දීමනා පත්‍ර සංඛ්‍යාව 5,546 ක් වූ අතර දෙපාර්තමේන්තු කාර්යසාධන වාර්තාවට අනුව සකස් කළ දීමනා පත්‍ර සංඛ්‍යාව 4,983 ක් වීමෙන් 549 ක වෙනසක් නිරීක්ෂණය විය.

**4.9 කළමනාකරණ දූර්වලතා**
---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) කිරිදි ඔය නිවාස ණය ව්‍යාපෘතිය**
-----------------------------------

1993 වර්ෂයේ කිරිදි ඔය නිවාස ණය ව්‍යාපෘතිය යටතේ ජන පදිකයින් 1,436 ක් සඳහා සහනාධාර ක්‍රමය යටතේ රු.11,603,000 ක ණය ලබා දී තිබූ අතර 2014 වර්ෂය අවසානයට පැවති තත්ත්වය හා අය කරගැනීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(i) වසර 20 කට වැඩි කාලයකදී ඉහත ණය මුදලින් සියයට 69 ක් එනම් රු.8,043,725 ක් පමණක් අයවී තිබූ අතර රු.3,559,275 ක් එනම් සියයට 31 ක හිඟ ණය ශේෂයක් 2014 වර්ෂය අවසානයටද පැවැතුණි.

(ii) 2014 වර්ෂයේදී රු.193,300 ක මුදල් ප්‍රමාණයක් පමණක් අයකර ගෙන තිබුණු අතර එය මුළු ණය මුදලෙන් සියයට 1.6 ක් විය. ඒ අනුව ණය අයකරගැනීමේ පසුවිපරම් කටයුතු ඉතාම දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ආ) දෙපාර්තමේන්තුව සතු නිල නිවාස භාවිතය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව සතුව පවතින නිල නිවාස 310 කින් කුළී අයවන නිවාස 90 ක් වූ අතර එය නිවාස සංඛ්‍යාවෙන් සියයට 29 ක් වී තිබුණි.

(ii) ඉතිරි නිල නිවාස 220 න් නිල නිවාස 70 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේද නිවාස 22 ක් විනාශ වෙමින්ද පැවති බවද නිරීක්ෂණය වූ අතර නිවාස 23 ක් හිස්ව පැවතුණි. ඒ අනුව මුළු නිවාසවලින් සියයට 37 ක්ම නිෂ්කාර්යයව පැවතුණි.

(iii) තවද අනවසර පදිංචිකරුවන් නිල නිවාස 37 ක පදිංචිව සිටින අතර එම නිල නිවාසවලින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 50 | 38 | 12 |
| (ii) | තෘතියික මට්ටම | 38 | 13 | 25 |
| (iii) | ද්විතියික මට්ටම | 700 | 430 | 270 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 135 | 97 | 38 |
| | **එකතුව** | **923** | **578** | **345** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 345 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 5. ශීර්ෂ 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

### 5.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

### 5.2 විසර්ජන ගිණුම

#### 5.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 82 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 04 කට අදාලව ඉතිරිවීම් ඉක්මවා රු.438,824 ක බැරකම්වලට එළඹ තිබුණි.

### 5.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 28701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.726,417 ක්වූ අතර, වර්ෂ 1 සිට වර්ෂ 7 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂ 2 කට වැඩි කාලයක සිට පැවැත එන රු.216,922 ක ශේෂයක් හා සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ක් කාලයක් ඉක්මවූ රු.31,391 ක් ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 5.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 5.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාරමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 5.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇස්තමේන්තු ඉක්මවා අවස්ථා 11 කදී රු.3,606,658 ක මිලදී ගැනීම් සිදු කර තිබුණු අතර, අවස්ථා 19 කට අදාළව රු.1,935,000 ක ඇස්තමේන්තුගත මිලදී ගැනීම් සිදු කර නොතිබුණි.

(ආ) බිම් සවිය වැඩසටහනේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇස්තමේන්තු ඉක්මවා අවස්ථා 05 කදී රු.3,550,098 ක මිලදී ගැනීම් සිදු කර තිබුණු අතර අවස්ථා 16 කට අදාළව රු.3,093,000 ක ඇස්තමේන්තුගත මිලදී ගැනීම් සිදු කර නොතිබුණි.

### 5.4.3 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින්ද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 5.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | රු. | |
| කාර්යාල උපකරණ | 21 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |
| පරිගණක හා උපාංග | 121 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |
| ලී බඩු හා සවි කිරීම් | 77 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |
| ස්ටෑන්ඩඩ් බයිසිකල් | 04 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |
| වෙනත් වත්කම් | 242 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය සතු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | සංඛ්‍යාව/ ඒකක ගණන/ ප්‍රමාණය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| | | රු. | |
| වාහන | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | 36,000,000 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | 55,404,247 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | 328,795 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 ට අඩු බැරකම්වල වටිනාකම රු.797,756 ක් වී තිබුණි.

**5.6 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

1931 ඔක්තෝබර් 23 දිනැති ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත අනුව දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින ගම් පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| **විස්තරය** | **ගම් සංඛ්‍යාව** |
|---|---|
| නිරවුල් කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින | 57 |
| උතුරු නැගෙනහිර පළාත්වල දැන්වීම් ප්‍රසිද්ධ කර ඇති | 30 |
| දැන්වීම් ප්‍රසිද්ධ කර ඇතත් ලේඛන අස්ථානගත වී ඇති | 57 |
| නිරවුල් කිරීමේ ආඥාව ප්‍රසිද්ධ කර ඇතත් නිදහස් කර නොමැති ගම් සංඛ්‍යාව | 20 |
| එකතුව | 164 |

(ii) 1931 ඔක්තෝබර් 23 දිනැති ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත අනුව දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ වන්නේ උරුම අයදුම්පත් කැඳවීම, විමර්ශන කටයුතු සිදු කිරීම සහ ගම් නිදහස් කිරීම ඇතුළු කටයුතු කිරීම වුවද දැන්වීම් ප්‍රසිද්ධ කර තිබුණත් ලේඛන අස්ථානගත වී තිබුණු ගම් 57 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

**(ආ) සැලැසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කර නොමැති අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) දෙපාර්තමේන්තුවේ බිම් සවිය වැඩසටහනේ 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්කගත අරමුණු ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

| **විස්තරය** | **ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්කගත අරමුණු (ඉඩම් කැබලි)** | **කාර්යසාධන වාර්තාව අනුව 2014 වර්ෂයේ ප්‍රගතිය (ඉඩම් කැබලි)** |
|---|---|---|
| ------------ | ---------------------- | ---------------------- |
| ක්ෂේත්‍ර විමර්ශනය | 130,000 | දක්වා නොමැත |
| ඉඩම් ලියාපදිංචි පරීක්ෂණ | 125,000 | දක්වා නොමැත |
| අවසන් තීරණ ලබාගත් කැබලි සංඛ්‍යාව | 123,840 | 53,062 |
| ගැසට් කළ කැබලි සංඛ්‍යාව | 123,840 | 66,759 |
| ඉඩම් රෙජිස්ටාර් වෙත යවන ලද කැබලි සංඛ්‍යාව | 123,840 | 59,747 |

(ii) දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්මට අනුව 14 වන වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා අනුමත කරන ලද කැබලි සංඛ්‍යාව 123,840 ක් වුවද කැබලි 66,759 ක් එනම් සියයට 54 ක් පමණක් ගැසට් කර තිබුණි.

(iii) මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනුම් කළ කැබලි 108,432 ක් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණද, ඉඩම් රෙජිස්ටාර් ජනරාල් වෙත යැවීමට කටයුතු කර තිබුණේ ඉන් කැබලි 59,747 ක් එනම් සියයට 55 ක් පමණි.

(iv) දෙපාර්තමේන්තුවේ 2014 කාර්යසාධන වාර්තාවට අනුව 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා අනුමැතියෙන් පසු එවා තිබුණු උපලේඛන සංඛ්‍යාව 53,062 ක් වී තිබුණි. 2014 දෙසැම්බර් මාසයේ ප්‍රගති වාර්තාවට අනුව එම සංඛ්‍යාව 53,448 ක් ලෙස දක්වා තිබුණු අතර ඒ අනුව 386 ක වෙනසක් පැවැතුණි.

(v) දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සහතික නිකුත් කිරීමට ඉඩම් රෙජිස්ටාර් වෙත යැවූ ප්‍රමාණය සඳහා වූ ඉලක්කගත කැබලි සංඛ්‍යාව 123,840 ක් වී තිබුණි. ඉඩම් අමාත්‍යාංශයේ බිම් සවිය වැඩසටහනට අනුව ඉලක්කගත කැබලි සංඛ්‍යාව 129,240 ක් වූයෙන් 5,400 ක වෙනසක් පැවැතුණි.

**5.7 පාඩු හා හානි**

2013 වර්ෂයේ විසර්ජන ගිණුමේ පාඩු හා අත්හැරීම් යටතේ දක්වා තිබුණු රු.571,066 ක වාහන අනතුරු අලාභයෙන් රු.40,000 ක් රියදුරුගේ වැටුපෙන් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණද අලාභයේ මුළු වටිනාකම විසර්ජන ගිණුමේ පාඩු හා අත්හැරීම් යටතේ දක්වා තිබුණි.

**5.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 106 | 20 | 86 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,751 | 630 | 1,121 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 200 | 156 | 44 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 27 | - | 27 |
| | **එකතුව** | **2,059** | **833** | **★ 1,253** | **27** |

★ සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1,253 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 6 ශීර්ෂ 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### 6.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර නොතිබූ අතර නියැදි පරීක්ෂාවකට අනුව වාහන 02 කට සිදුව තිබුණු අනතුරු හේතුවෙන් වූ පාඩුව රු.25,625 ක් හා නැතිවූ භාණ්ඩවල අලාභය වූ රු.199,747 ක් පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

### 6.2 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේතයකට ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

#### (අ) 20-03-02-04 දරන ආදායම් සංකේතය - මැනුම්පති ආදායම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාලව රු.මිලියන 135 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 132.8 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 98 ක් වි තිබුණි.

(ii) 2015 ආදායම් ඇස්තමේන්තුවට අනුව 2014 සංශෝධිත ඇස්තමේන්තුව රු.මිලියන 135 ක් වුවද, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ආදායම් ගිණුමෙහි 2014 වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 115 ලෙස දක්වා තිබුණි.

(iii) ආදායම් පුරෝකථනය හා ඇස්තමේන්තු කිරීමේදි 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයෙහි 5 ඡේදය ප්‍රකාරව අතීත ප්‍රවණතාවයන් හා ඒවායේ විශේෂ ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කළ යුතු වුවද, පසුගිය වර්ෂ හා සමාලෝචිත වර්ෂයේදී ද ඌන ආදායම්

ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය. 2014 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව 2013 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ අගයටත් වඩා අඩු අගයක ඇස්තමේන්තුවක් වී තිබුණි.

(iv) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අය කරගෙන තිබූ මැනුම් ගාස්තු රු.2,202,056 ක් මැනුම්පති ආදායමට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(v) ශ්‍රී ලංකා UN-REDD Programme යටතේ 1:100,000 පරිමාණයෙන් පිළියෙල කර ඇති ඉඩම් පරිහරණ සිතියම් ආංකිත දත්ත බවට පත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සඳහා 2014 ඔක්තෝබර් 29 දින ලැබී තිබුණු රු.934,840 ක් මැනුම්පති ආදායමට බැර නොකොට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(vi) 2014 වර්ෂයේ මැනුම් ගාස්තු ආදායම හා තැන්පත් ගිණුමේ ඉදිරියට ගෙන ගිය ශේෂය පිළිවෙලින් රු.320,646,374 ක් හා රු.109,449,171 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී මැනුම්පති ආදායමට රු.100,283,165 ක් පමණක් බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී මැනුම්පති ආදායමට බැර කර තිබුණු ප්‍රමාණය මුළු මැනුම් ගාස්තු ආදායමින් සියයට 24 ක් වී තිබුණි.

(vii) මැනුම්පතිවරයා විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2014 දෙසැම්බර් 31 දිනට ආදායම් ගිණුමේ හා පොදු තැන්පත් ගිණුමේ ශේෂයන් අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| **විස්තරය** | **ඉදිරිපත් කළ තොරතුරු අනුව ශේෂය** | **ගිණුම් අනුව ශේෂය** |
|---|---|---|
| ----------- | ------------------------- | -------------- |
| | **රු.** | **රු.** |
| 2013 දෙසැම්බර් 31 දිනට මැනුම් ගාස්තු ලෙස පොදු තැන්පත් ගිණුමේ ඉදිරියට ගෙන ආ ශේෂය | 109,449,171 | 70,093,201 |

| | | |
|---|---|---|
| මැනුම් ගාස්තු ලෙස මැනුම්පති ආදායමට බැර කරන ලද වටිනාකම | 103,066,101 | 100,283,185 |
| 2014 දෙසැම්බර් 31 දිනට මැනුම් ගාස්තු ලෙස පොදු තැන්පත් ගිණුමේ ඇති ශේෂය | 292,372,522 | 92,753,686 |

(viii) රාජ්‍ය ආදායමින් වියදම් දැරීම සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවලින් දිගින් දිගටම අවධානය යොමු කර තිබුණද, දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේදීද මැනුම් ගාස්තු ලෙස අයකර තිබුණු රු. 430,095,545 ක ආදායමින් රු.292,372,522 ක් දිරිදීමනා, ගමන් වියදම්, ඉන්ධන හා වෙනත් වියදම් වශයෙන් ගෙවා තිබුණි.

(ix) විශේෂ ව්‍යාපෘති සඳහා මැනුම් ගාස්තු ලෙස ලැබෙන මුදල් මැනුම්පති ආදායමට බැර වන අතර එම මැනුම් කාර්ය දිරිදීමනා යටතේ ඉටු කළේ නම් 1/2009 දිරිදීමනා චක්‍රලේඛයට අනුව දිරිදීමනා ගෙවීමට අවශ්‍ය මුදල සඳහා ප්‍රතිපාදන ලබාගෙන ගෙවීම් කරනු ලබන බව විගණන විමසුම්වලට පිළිතුරු ලෙස දක්වා තිබුණි. එම වැය විෂයය යටතේ දිරිදීමනා වශයෙන් රු.16,528,181 ක් ගෙවා තිබුණු අතර අදාල වැය විෂයයට හර නොවී මැනුම් ගාස්තු ආදායමින් ගෙවා තිබූ දිරිදීමනා වටිනාකම රු.85,542,690 ක් වි තිබුණි.

## 6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විෂය අංක 28801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදී එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.13,852,006 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 06 සිට අවුරුදු 32 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගන්නා ලද හා මියගිය නිලධාරීන්ගෙන් හිඟහිටි ණය ශේෂය රු.6,992,084 ක් වි තිබුණු අතර එම ශේෂ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5 හා 4.4 වගන්ති ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

(ඇ) සේවය අතහැර ගිය නිලධාරීන්ගේ සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,982,025 ක් හිඟහිටව පැවැතුණි. ඉන් රු.3,451,791 ක් හෙවත් සියයට 69 ක් වසර 5 කට වැඩි කාලයක සිට පැවැත එන ශේෂ විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර එම ශේෂ අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඈ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදය ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ 2014 දෙසැම්බර් 31 දිනට රු.1,484,705 ක හිඟහිටි ණය ශේෂ අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 6.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත වාහන 2 ක් අවිධිමත් ලෙස මුදා හැර තිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) දෙපාර්තමේන්තුව වෙත වන සම්පත් හා පාරිසරික අමාත්‍යාංශය විසින් වාහන 4 ක් ද, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් වාහන 17 ක් ද, ලබා දී තිබුණද ඒවා ලබාදුන් දිනයන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවූ අතර එම වාහන විධිමත් ලෙස පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ii) බිම්සවිය යටතේ වන ප්‍රතිපාදනවලින් රු.මිලියන 217 ක් වැයකර මිලදී ගන්නා ලද මැනුම් උපකරණ ඇතුළු විවිධ ප්‍රාග්ධන වත්කම් හා රු. මිලියන 82 ක් වැයකර

ඉදිකරන ලද දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන් පවරාගැනීමකින් තොරව පරිහරණය කර තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

----------------------------

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයට අඩු කාලයක සිට පැවැත එන රු.6,047,316 ක බැරකම් විය.

**6.6 කාර්යසාධනය**

---------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2014 වර්ෂයේ මායිම් ගල් දැමීමේ මැනුම්වල ඉලක්ක කැබලි සංඛ්‍යාව 52,156 ක් වුවද, එය කාර්යසාධන වාර්තාවේ කැබලි 40,489 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව කැබලි 35,772 ක් එනම් සියයට 69 ක් පමණක් මැනීම් කර තිබුණි.

(ii) බිම්සවිය වැඩසටහන යටතේ 2007 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කොට්ඨාශ 97 ක වැඩ ආරම්භ කර තිබුණද, 2014 වර්ෂය අවසානය වන විටත් කොට්ඨාශ 05 ක පමණක් වැඩ නිම කර තිබුණි.

(iii) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් මැනුම් කර දීමනා පත්‍ර ලබා දීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබී තිබුණු රේඛා චිත්‍ර ඉල්ලීම් සංඛ්‍යාවෙන් රේඛා චිත්‍ර 16,595 ක් පමණක් නිමකර තිබුණි. තවදුරටත් කටයුතු කළ යුතුව පැවතුණු සංඛ්‍යාව 77,145 ක් වී තිබුණි. 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ රේඛා චිත්‍ර නිකුත් කිරීමේ ඉලක්ක දක්වා නොතිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

-----------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධන වාර්තාවේ විවිධ මැනුම් සහ ඉඩම් අත්කර ගැනීමේ මැනුම්වල ප්‍රගතිය පිළිවෙලින් සියයට 280 ක් හා සියයට 219 ක්ව පැවතුණි. ඒ අනුව 2014 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී ඉහත මැනුම් සඳහා අඩුවෙන් ඉලක්ක යොදා පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**6.7 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිරි දීමනා ගෙවීමේදී මිනින්දෝරුවරයකු මාසිකව ඉටුකළ යුතු අවම වැඩ ප්‍රමාණය (Monthly Norms) තීරණය කර තිබුණද මසකට දිරි දීමනා ගෙවීමට අදාළ කරගත හැකි උපරිම කැබලි සංඛ්‍යාවක් හෝ මූලික වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස ගෙවිය හැකි සීමාවක් තීරණය කර නොතිබුණු අතර 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා දිරි දීමනා හා අධීක්ෂණ ගාස්තු ගෙවා තිබුණි. ඒ අනුව 2014 වර්ෂයේදී දිරිදීමනා හා අධීක්ෂණ ගාස්තු වශයෙන් පමණක් ඔවුන්ගේ වාර්ෂික මූලික වැටුප මෙන් දෙගුණයද ඉක්මවා ගෙවීම් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වාර්ෂික මූලික වැටුපෙන් සියයට ගණන | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| 50-99 | 97 |
| 100-149 | 44 |
| 150-199 | 28 |
| 200 වඩා වැඩි | 38 |

(ආ) වර්තමානයේ මැනුම් කටයුතු ඉතා දියුණු තාක්ෂණික උපකරණ මෙන්ම චන්ද්‍රිකා හා පරිගණක තාක්ෂණය වැනි ක්‍රමවේදයන් යොදාගෙන සිදු කරනු ලබන අතරම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රමාණවත් මැනුම් උපකරණ මිලදී ගෙන තිබුණි. වසර තිහකටත් වඩා පැරණි ක්‍රමවේදයක් වන මිනින්දෝරුවරයෙකු විසින් මසකට මැනිය යුතු අවම කැබලි සංඛ්‍යාව 30 ක සීමාවට යටත්ව මැනුම් කටයුතු සිදුකිරීම කාලෝචිත නොවන බැවින් ඉහත දිරිදීමනා ගෙවීමේ විෂමකාරී තත්ත්වයට එය ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**6.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 243 | 119 | 124 |
| (ii) | තෘතියික මට්ටම | 959 | 888 | 71 |
| (iii) | ද්විතියික මට්ටම | 1,341 | 1,064 | 277 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4,871 | 3,520 | 1,351 |
| | **එකතුව** | **7,414** | **5,591** | **1,823** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1,823 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 7 ශීර්ෂ 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

### 7.1 ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම

දෙපාර්තමේන්තුව ස්ථාවර වත්කම් ලේඛනය යවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

### 7.2 විසර්ජන ගිණුම

#### 7.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ සාකච්ඡා වැඩමුළුවක් සඳහා ආහාරපාන, නවාතැන්, පහසුකම් හා සමරු කලාප මුද්‍රණය වැනි පුනරාවර්තන ස්වභාවයේ රු.1,892,849 ක වියදම්ද, 2014 පෙබරවාරි හා සැප්තැම්බර් මාසවලදී අවස්ථා 45 කදී එකතුව රු.815,576 ක් සංග්‍රහ වියදම්ද මූලධන වැය විෂයකින් වියදම් කර තිබුණි.

**7.2.2 වෙනත් අමාත්‍යංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැව්ලි බෝග සිතියම්ගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට වැව්ලි කර්මාන්ත අමාත්‍යංශයෙන් ලබාදී තිබූ රු.10,000,000 ක ප්‍රතිපාදනවලින් රු.4,600,000 ක් දිස්ත්‍රික් කාර්යාලවලට ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සඳහා රු.3,682,377 ක් වියදම් කර තිබුණි. දිස්ත්‍රික් කාර්යාල විසින් කර තිබුණු වියදම පිළිබඳ තොරතුරු ලබා ගෙන නොතිබීම නිසා අදාළ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වැය කරන ලද සමස්ත වියදම විගණනයේදී තහවුරු කර ගැනිමට නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුවට උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන සඳහා ඉඩම් අමාත්‍යංශයෙන් ලබා දී තිබුණු රු.මිලියන 25 ක ප්‍රතිපාදනවලින් දිස්ත්‍රික් කාර්යාල වෙත රු.මිලියන 8.878 ක් ලබා දී තිබුණි. දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය රු. මිලියන 9.569 ක් වැය කර තිබුණද දිස්ත්‍රික් කාර්යාල විසින් කර තිබුණු වියදම 2015 ජූලි 21 දින වන විටත් විගණනය වෙත ලබාදී නොතිබුණු හෙයින් සමස්ත වියදම තහවුරු කර ගැනිමට නොහැකි විය.

**7.3 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.166,125 ක්වූ තැන්පතු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**7.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 32701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.651,607 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ සඳහා වර්ෂ 01 සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණු බව නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

## 7.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 7.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය සඳහා 2013 දෙසැම්බර් 30 දින පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්කයන් සංශෝධනය කර තිබූ අතර සංශෝධනය කරන ලද දිනය විගණනයට දන්වා නොතිබුණි.

### 7.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව ඊළඟ එළඹෙන වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැසුම විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවද, 2014 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලසුමෙහි රු.610,042 ක් වැයකර සමරු කලාප මුද්‍රණය, රු. 143,640 ක් වැයකර තාප්පයේ චිත්‍ර ඇඳීම හා රු.1,870,178 ක් වැයකර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සාකච්ඡා කිරීමේ වැඩමුළුව පිළිබඳව තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

### 7.5.3 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මකව නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින්ද ප්‍රධාන කාර්යාලයේද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනය සිදුකර නොතිබුණු අතර ප්‍රාදේශීය කාර්යාලවල අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 7.6 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | පරිගණක හා උපාංග | 136 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |
| (ii) | කාර්යාල උපකරණ | 130 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |
| (iii) | ලීබඩු හා සවිකිරීම් | 79 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |
| (iv) | වෙනත් වත්කම් | 1,589 | තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. |

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතු වාහන 21 ක් දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි පවරා නොගෙන භාවිතයට ගෙන තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු බේරුම් නොකළ බැරකම් රු. 1,402,540 ක් විය.

## 7.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන චක්‍රලේඛය | 610,042 | සමරු කලාපය මුද්‍රණය කරගැනීම සඳහා තෝරාගත් ආයතනයෙන් ලබාගත් මිල ගණන් අවස්ථා 03 කදී සංශෝධනය කර තිබුණි. රාජ්‍ය අංශයේ භාණ්ඩ, වැඩ හා සේවා ප්‍රසම්පාදන ඇස්තමේන්තු සකස් කිරීමේදී සියලු කරුණු සැලකිල්ලට ගෙන හැකිතාක් දුරට නිවැරදිව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමට රාජ්‍ය ආයතන වගබලා ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**(ආ) ජාතික අයවැය චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.6 හා 1.1.7 ඡේද | 345,266<br>389,880 | 2014 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂය රු.345,266 ක් හා ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂය රු.389,880 ක් වූයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 2014 ජනවාරි 01 දිනැති අංක1/2014 දරන චක්‍රලේඛයෙහි 2.2.2 ඡේදය | | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ සාකච්ඡා කිරී ම මූලික අරමුණ කරගෙන පැවැත්වූ වැඩමුළුව සඳහා රු.1,870,178 ක් වැය කර තිබුණත්, අපේක්ෂිත මූලික අරමුණින් බැහැරව වැඩ සටහන පවත්වා තිබුණු බව නිරීක්ෂණය විය. |
| (iii) | 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛයෙහි 2.1.5 ඡේදය | | අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය හා භාණ්ඩාගාරයේ එකඟතාවය නොමැතිව නිලධාරීන් 330 දෙනෙකු සඳහා රු. 500 බැගින් ද, නිලධාරීන් 4 දෙනෙකු සඳහා රු. 425 බැගින්ද හා කාර්යාල කාර්ය සහායකයින් 4 දෙනෙකු සඳහා රු.350 බැගින්ද වශයෙන් එකතුව වූ රු.218,100 ක් ගෙවා තිබුණි. |

## 7.8 දේශීය මූලාකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂම් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුවට රු.මිලියන 25 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු නමුත් එයින් රු. මිලියන 13.4 ක් පමණ උපයෝජනය කර තිබූ හෙයින් ඉතිරිය සියයට 46 ක් වී තිබුණි.

(ii) 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂම් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාකාරකම් 05 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ප්‍රාදේශීය මට්ටමෙන් ග්‍රාහක කණ්ඩායම් දැනුවත් කිරීම් 79 ක් ඉලක්ක ගත කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දිනට වැඩසටහන් 18 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(iii) 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂම් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 23.455 ක් වශයෙන් දක්වා තිබියදී රු.මිලියන 25 ක ප්‍රතිපාදනයක් ලබාගෙන තිබූ හෙයින් රු.මිලියන 1.545 ක් වැඩිපුර ලබාගෙන තිබුණි.

(iv) 2014 වර්ෂයේ කාර්යසාධන වාර්තාවෙහි උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්ම අනුව සැසඳිය හැකි ආකාරයට ඉදිරිපත් කර නොතිබුණි.

## 7.9 කාර්යසාධනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2014 වර්ෂයේදී ක්‍රියාකාරකම් 03 ක ප්‍රගතිය සියයට 66 සිට සියයට 39 ක දක්වා පරාසයක පැවතුණු අතර ක්‍රියාකාරකම් 04 ක ඉලක්කගත ඒකක ගණන සහ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව ඉලක්කගත ඒකක ගණන අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

**7.10 අවිධිමත් ගනුදෙනු**

---

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවද, දෙපර්තමේන්තුව සමරු කලාප මුද්‍රණය සඳහා රු.610,042 ක් වැය කර තිබුණත්, ඒ සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිලියෙල කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 මාර්ගෝපදේශය රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්වලදී දෙපාර්තමේන්තුව හා සැපයුම්කරු අතර විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවද, සමරු කලාපය මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

**7.11 අනාර්ථික ගනුදෙනු**

---

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව සිදුව තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2014 වර්ෂයේ සමරු කලාප මුද්‍රණය සඳහා රු.610,042 ක් වැය කර තිබුණු අතර එහි මිල ගණන්හි වැඩිවීම සඳහා ප්‍රසම්පාදන අනුමැතිය ලබාගැනීමට ප්‍රථම සැපයුම්කරු සමරු කලාප මුද්‍රණය කර දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. තවද සමරු කලාපය මුද්‍රණය කිරීමේදී අවශ්‍ය පිටු ගණන, මුද්‍රණය කළ යුතු ප්‍රමාණය සහ එහි ඇතුළත් කළ යුතු කරුණු මොනවාද යනාදිය පිළිබඳව ඉහළ කළමණාකාරිත්වය විසින් නිසි පරිදි අධ්‍යයනය කිරීමක් කර නොතිබුණු අතර ඵලදායි නොවන අයුරින් රාජ්‍ය මුදල් යොදවා ඇති බව නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ සාකච්ඡා කිරීමේ වැඩමුළුව සඳහා සහභාගී වූ නිලධාරීන් වෙනුවෙන් ආහාර හා නවාතැන් සඳහා රු. 874,070 ක් වැයකර තිබුණද එම වැඩමුළුවට සහභාගී වූ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කෙරෙන ලේඛන නිසි පරිදි නඩත්තු කර නොතිබුණු හෙයින් එම වියදම් විනිවිදභාවයකින් සිදුකර ඇති බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

තවද ක්‍රියාකාරී සැලැස්ම සාකච්ඡා කිරීම සඳහා න්‍යාය පත්‍රය අනුව පැයක කාලයක් පමණක් වෙන් කර තිබූ හෙයින් මෙම වැඩමුළුව පවත්වා ඇත්තේ එම කාර්යයන් සාක්ෂාත් කරගැනීම සඳහා නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 7.12 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 9 | 4 | - |
| (ii) | තෘතියික මට්ටම | 26 | 15 | 11 | - |
| (iii) | ද්විතියික මට්ටම | 547 | 496 | 56 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 91 | 62 | 29 | - |
| | **එකතුව** | **677** | **582** | ★ **100** | **05** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 100 පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර අතිරික්ත තනතුරු සංඛ්‍යාව 05 ක් වී තිබුණත්, ඒ සඳහා අනුමැතිය ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.